**සංචාරක සංවර්ධන අරමුදල 2013**

**------------------------------------**

සංචාරක සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

2.2.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24(2) වගන්තිය සංශෝධිතව කියවිය යුතු 2003 අංක 25 දරන මුදල් පනතේ 11 කොටස | සංචාරක බදු අය කර ගැනීමේ වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං.බ) අය කර දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවත් අරමුදල මෙම නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ | |
| I. 24 (3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. |
| II. 24 (8) වගන්තිය | සංචාරක සංවර්ධන අරමුදලේ බැරට ඇති සියළු මුදල් අදාල ආයතන වෙත බෙදා හැරිය යුතු වුවත් 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමේ රු.822,889,100 ක මුදලක් බෙදාහැරීමට තිබුණි. |
| (ඇ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (ආ) උප වගන්තිය | ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් |

කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එලෙස නැව් මගින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණ අතර නැව් මගින් ගමන් ගන්නා මගීන්ගෙන් අයවීම් නොමැති බවට සනාථ කිරීම් ලබාගෙනද නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි අංක 486

2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලයට අදාල අඟරු චෙක්පත් 7 ක එකතු වටිනාකම වූ රු.143,504 ක ප්‍රමාණය අයකිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතුවලින් ජනනය වූ ආදායම රු. මිලියන 2,625 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම රු. මිලියන 1,975 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 650 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සංචාරක සංවර්ධන බදු ආදායම් රු. මිලියන 443.2 කින් සහ අපගමන බදු ආදායම රු. මිලියන 204.7 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ආදායම රු.මිලියන 2,625 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,975 සමග සැසඳීමේදී සියයට 32.9 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ අරමුදලේ පරිපාලනය වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 4 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු.මිලියන 5ක් වැය කර තිබුණි. ඒ අනුව පරිපාලන වියදම සියයට 25 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

4.1.1 අරමුදල් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල මගින් පරිපාලන වියදම් ලෙස රු. 5,193,657 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන සලසා නොතිබුණි.

(ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන අනුව 2003 අගෝස්තු 29 දිනැති අංක 1303/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අපගමන බද්ද ගුවන් මගින් පිටවන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 15 ක්ද, නැවකින් පිටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 2.5 ක් අය කල යුතු වුවද, මෙම අපගමන බද්ද අය කරන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා එක්සත් ජනපද ඩොලර් එකකට රු 100 ක විනිමය හුවමාරු අනුපාතයක් පදනම් කරගෙන මෙම බද්ද අය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී ද අරමුදලට ලැබිය යුතු අපගමන බදු සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වී තිබුණි. එම ප්‍රමාණය රු. මිලියන 400 ක් බව හෙළිදරව් විය.

(ඇ) සංචාරක සංවර්ධන බදු අයකර ගත යුතු ආයතන පිළිබඳව දත්ත සමුදායක් සකස් කර නොතිබුණි. තවද ඒ ඒ වර්ෂ වල අය කල බද්ද හා ආයතනවල විකුණුම් ආදායම ලේඛනගත කර නොතිබු බැවින් හිඟ බදු පිළිබඳව නියාමනයක් සිදු කර නොතිබුණි.

(ඈ) 2003 දෙසැම්බර් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 1 හා 4 ජේදයන්හි නියෝග ප්‍රකාර සංචාරක බදු මුදල් නොගෙවීම නිසා පනවන ලද දඩ මුදල් ප්‍රමාණවත් නොවීම මත අධිකාරියට මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

(ඉ) 2013 අංක 25 දරන මුදල් පනතේ 4(2) වගන්තිය ප්‍රකාර ගුවන් සමාගම් විසින් නියමිත කාලය තුල බදු නොගෙවන අවස්ථාවලදී අදාල දඩ පොලී සමග එකී මුදල් අයකර අධිකාරිය වෙත ප්‍රේෂණය කරන්නේද යන්න තහවුරු කිරීම් කරවාගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 6.5.1 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත අවසන් ගිණුම් ඉදිරිපත් කලයුතු වුවත් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2014 මාර්තු 14 වන දිනදී ය.

5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා සත්‍ය අගයන් අතර සැලකිය යුතු විචලනයන් (විචලන පරාසය සියයට 9 සිට සියයට 15 දක්වා) සහිත විෂයන් 03ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව දක්නට නොලැබුණි.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.
(ආ) අරමුදල් බෙදා හැරීම.
(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම.
(ඈ) අපගමන බදු එකතු කිරීම.
(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මූල්‍ය වාර්තා සමාලෝචනය.